# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (නව නිර්දේශය)

## 2022 මාර්තු/අප්‍රේල්

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල - SINH E 1025

## පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

**පළමු වන කොටසත් , දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

### 1 කොටස

1. (අ) පහත සඳහන් ඡේදය වත්මන් ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කර දක්වන්න.

එකෙණෙහි ඒ මිත්‍රද්‍රෝහී රජ්ජුරුවන් සරහා පිළියෙල කරන ලද ඇත් කඳ මත්තට නැඟී මහත් වූ පෙළහරින් නුවර පැදකුණු කෙරෙමින් ඒ රජ්ජුරුවෝ ඇත් කඳ මත්තේ හිඳ බෝධිසත්ත්වයන් දුර දී ම දැක, 'මේ කුට තාපසයා මා සමීපයේ වළඳා වළඳා වසනු කැමති ව ආයේ ය. ඒ කාලකණ්ණි යම් තාක් පර්ෂත් මධ්‍යයෙහි තමා මට කළ ගුණ ප්‍රකාශ කෙරේ නම් තපුර. ඊට පළමු කොට ම ඔහුගේ හිස කප්පා පියමි' යි සිතා රාජ පුරුෂයන් මූණ බැලුයේ ය. රාජ පුරුෂයෝ "ස්වාමීනි, කුමක් කරමෝ දැ" යි කී කල්හි "මේ කුට තාපසයා මාගෙන් කිසිවක් ඉල්වනු කැමති ව ආයේ යි සිතමි. ඒ කාලකණ්ණි තාපසයා මා දැක්ක නොදී ඔහු අල්වා ගෙන පිටිතල හයා බැඳ සතරමං සන්ධියක් පාසා මර මරා නුවරින් පිටත් කොට දම් ගෙඩියෙහි දී ඔහුගේ හිස කපා මිනිය ගෙන ගොස් උල ඇන පියව" යි විධාන කළෝය. ඒ රාජ පුරුෂයෝ "රජ්ජුරුවන් කී බස් යහපතැ" යි පිළිගෙන ගොස් නිරපරාධ වූ මහ බෝසතාණන් බැඳ ගෙන සතරමං සන්ධියේ දී මරමින් දම් ගෙඩිය සමීපයට ගෙන යන්ට පටන් ගත්තාහු ය.

ලකුණු 12(8+4)

(ආ) පහත සඳහන් පද්‍යයන්ගේ අර්ථය වත්මන් ලිහිල් බසින් ලියා, කවියා සතු වර්ණනා චාතුර්යය සැකවින් අගයන්න.

පෙර ව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්
ප ර ව තඹර පෙති ගිලි දියතලා පිටින්
ත ර ව සිහි ඇතිව පරතෙරට යන අටින්
ක ර ව පියාසර සකි කොන්තගම් තොටින්

ක ලු වැල් කපුරු දුම තුළ ලෙළෙන දද පෙළ
සු වි ස ල් මිහිඟු සක් සන් මිණි හඬ වතළ
කැරලොල් සතත් පවසන තියු ගී දෙමළ
ම න ක ල් ඉසුරු කෝවිල ලගිනේ ලකළ

වෙ ස ඝන තුඟු තන යුග රොන් කොකු මඟර
පි ස එත මඳ පවන් ඇද විල්ලිහිණි සර
ගොස අලුයම් පසතුරු සවනතෙහි කැර
ඇ ස නිදිගැට හැර නැඟ සිටු උදාහිර

| | | | |
|---|---|---|---|
| උ | දා | ගිරි කසුන් රිටි වැට හිසැ | බැබළී |
| එ | දා | සහසකර පහනෙව් කරත | හෙළී |
| යොදා | | නුවන් ඉසුරුට කරන පුද | කෙළී |
| වි | දා | පියා නිලඹර යන් තො වී | මැළී |

ලකුණු 12(8+4)

## 11 කොටස

2. මනුෂ්‍ය ජීවිතය හා විවිධ චරිත ගැඹුරු පරිඥානයකින් යුතුව නිරූපණය කිරීම නිසා ජාතකකථා, සර්වකාලීන අගයකින් යුතු රචනා බවට පත්ව තිබේ. සසාධකව විමර්ශනය කරන්න.

3. ශබ්ද මාධූර්යය හා අර්ථ මාධූර්යය එක්තැන් කළ විශිෂ්ට නිර්මාණයක් වීම සැළලිහිණි සන්දේශයේ විශේෂතාව යි. නිදසුන් දෙමින් පිරික්සන්න.

4. පූජාවස්තු මුල් කර ගත් ගද්‍ය නිර්මාණ රැසක් දක්නට ලැබීම කුරුණෑගල් යුගයේ සිංහල ගද්‍ය සාහිත්‍යයේ විශේෂත්වය යි. සාකච්ඡා කරන්න.

5. ගම්පොළ යුගයේ සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය නිර්මාණ පිළිබඳ සමාලෝචනයක් කරන්න.

නැතහොත්

කෝට්ටේ යුගය,සිංහල පද්‍ය සාහිත්‍යයේ සුවිශේෂ යුගයක් වන්නේ කවර කරුණු නිසාදැයි හේතු සාධක සහිතව පැහැදිලි කරන්න.

## 111 කොටස

6. 'භාෂාව' යනු කෙබඳු නිර්මාණයක්දැයි පැහැදිලි කර, එහි කාර්යභාරය විස්තර කරන්න.

7. උච්චාරණ කරණ හා උච්චාරණ ස්ථාන කෙරෙහි සාවධාන වෙමින් භාෂණ සිංහලයේ ශබ්දෝත්පාදන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

8. උපභාෂාවක් යනු කුමක්දැයි හඳුන්වා, එකම භාෂා සමාජයක විවිධ උපභාෂා පහළවීමෙහි ලා බලපාන ප්‍රධාන සාධක පරීක්ෂා කරන්න.

9. භාෂාද්විරූපතාව (diglossia) හඳුන්වා සිංහල භාෂාද්විරූපතාවේ විශේෂ ලක්ෂණ පරීක්ෂා කරන්න.

නැතහොත්

භාෂාව හා සංස්කෘතිය අතර පවත්නා සබඳතාව නිදසුන් ඇසුරින් විමසන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට සටහන් ලියන්න.
    i. සිංහලයේ ශබ්ද හෝඩිය හා අක්ෂර හෝඩිය
    ii. සිංහල භාෂාවේ ප්‍රාස්තාවික ලක්ෂණ
    iii. පරිමිත භාෂා ව්‍යවහාර
    iv. ලේඛන සිංහලයේ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රටා

(02 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 19 බැගින්)